# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2067/25 – 2018 අප්‍රේල් මස 19 වැනි බ්‍රහස්පතින්දා – 2018.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ 2018 අංක 01 දරන බඩු උකසග්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන පෙරේරා වන මම, බස්නාහිර පළාතේ, පළාත් සභාවේ 2018 අංක 01 දරන බඩු උකසග්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව 2018.03.23 දින ලැබී ඇති හෙයින්, එම ප්‍රඥප්තිය 2018.03.23 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන පෙරේරා,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.


1A – PG 4007– 507 (2018/04)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බස්නාහිර පළාතේ 2018 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය**

**2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2018 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ඇතුළත් කර මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ලියාපදිංචි බැංකුවක් විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය හැර බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද, ඊට ආනුශාංගික හෝ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 2001 අංක 03 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය 1942 අංක අංක 13 දරන බඩු උකස්ගන්නන්ගේ ආඥා පනතට සහ 1949 අංක 06 දරන උකස් ආඥාපනතේ ඇතැම් විධිවිධානයන්ට අනනුකූල වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

03. ප්‍රධාන ප්‍රඥප්තියේ 9(3) උප වගන්තියේ ''පළාත් සභාවේ'' යන වචන වෙනුවට ''ඉතිරි කිරීමේ'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

04. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 (3) උප වගන්තියේ ''එම මුද්දර සැපයීම සඳහා යන වියදම බඩු උකස්ගන්නා විසින් දැරිය යුතුය'' යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

05. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ ''මාස විසි හතරක'' යන වචන වෙනුවට ''මාස දෙළහක'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

06. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ ''ලියාපදිංචි බැංකුවක්'' යන යෙදුමේ අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ලියාපදිංචි බැංකුවක්'' යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ සඳහන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන උපලේඛනය සංශෝධනය කිරීම.

07. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ සඳහන් ''මාස විසිහතරක'' යන යෙදුම යෙදී ඇති සෑම තැන්හිම එකී යෙදුම වෙනුවට''මාස දෙළහක'' යන යෙදුම ආදේශ කිරීමෙන් දෙවන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

08. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

05 - 57

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.